ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
பொருளாதார அபிவிருத்தி அமைச்சு
Ministry of Economic Development

දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

24/4, කාසල් වීදිය, කොළඹ -8.
24/4, காசல் வீதி, கொழும்பு
24/4, Castle street , Colombo - 08.

මගේ අංකය / எனது இல / My No: DDD/Ho/MA/05

ඔබේ අංකය / உமது இல / Your No: ...........

දිනය / திகதி / Date: 2014 / 09/ 05

**දිවිනැගුම චක්‍රලේඛ අංක 7(1)2014**

සියළුම දිවිනැගුම ප්‍රජා මූල බැංකු කළමනාකරුවන් වෙත,

<u>**"දිවිනැගුම සහන අරුණ"**</u>

දිවිනැගුම ප්‍රතිලාභින්ගේ ජීවන තත්ත්වය හා ආදායම් උත්පාදන ක්‍රියාවලිය නඟා සිටුවීමේ අරමුණින් නිකුත් කරන ලද දිවිනැගුම චක්‍රලේඛ අංක 07/2014 දරණ 2014/08/22 දිනැති චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක කිරිමේදී පැන නැඟී ඇති ගැටළු නිරාකරණය කර ගැනීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් සඳහා මෙම 07(1) 2014 චක්‍රලේඛණය නිකුත් කරනු ලැබේ.

**1. ණය සඳහා හිමිකම් ලබන්නන්.**

දිවිනැගුම ප්‍රජාමූල බැංකුවල සාමාජිකත්වය ලබා මාස 03 ක් ඉක්මවා ඇති සාමාජිකයන්ට මෙම "දිවිනැගුම සහන අරුණ" ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගත හැකිය. මෙම ණය ලබාදීමේදි දිවිනැගුම සහනාධාරලාභින්ට සහ පාරිභෝගික ණය ඉල්ලුම් කරන්නන්ට ප්‍රමුඛතාවය ලබාදිය යුතුවේ.

**2. ණය ලබාදිමේ සීමාවන්.**

උපරිමය රු.5000/- දක්වා වූ පාරිභෝගික ණය හැර අනෙකුත් ණය වර්ග ලබාදීමේදි අදාල අවශ්‍යතාවය හෝ අදාල ව්‍යාපෘතිය අධ්‍යයනය කර, ඒ සඳහා වාර්තාවක් සකස් කොට එම අවශ්‍යතාවලට ගැලපෙන පරිදි ණය මුදල් වාරික වශයෙන් නිකුත් කිරිම කළ යුතුවේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක විමේ ප්‍රගතිය අනුව වාරික ලබාදීම සිදුකළ යුතුවේ. අනෙකුත් ණය වර්ගවල උපරිමය රු. 50,000/- ක් වන අතර අවශ්‍යතාවය අනුව ණය මුදල තීරණය කළ යුතුය.

**3. ආපසු ගෙවීමේ කාලය.**

රු 5000/- ට වැඩි ණය වසරක සහන කාලයකින් පසුව සමාන වාරික 24සිට 36 දක්වා කාලයකින් සුදුසු පරිදි තීරණය කොට අයකර ගැනීම සිදුකළ යුතුය.

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| දුරකථන/ தொலைபேசி/Telephone: | 011-2669703 | 011- 2669700 | 011-2685888 | 011-2669725 |
| ෆැක්ස්/ தொலைமடல்/Fax: | 011-2669709 | 011-2678203 | 011-2695579 | 011-2669725 |
| ඊ-මේල්/ மின்னஞ்சல்/E-Mail: | dgdivineguma@gmail.com | hrddivineguma@gmail.com | divinegumaaccbranch@gmail.com | |

4. ණය අනුමත කිරීම

දිවිනැඟුම ප්‍රතිලාභින් වෙත ණය නිකුත් කිරීම සඳහා බෙදා හරින ලද අයදුම්පත් දිවිනැඟුම ප්‍රතිලාභියා විසින් සම්පූර්ණ කර දිවිනැඟුම සංවර්ධන නිලධාරියාගේ නිර්දේශය ලබාදී,බැංකු කළමණාකරුවන් වෙත ලබාදීමෙන් අනතුරුව ,පාරිභෝගික ණය අයදුම්පත් එම අවස්ථාවේදීම බැංකුව විසින් ගෙවීම් කළ යුතු වේ.

රු.5,000 -/ට වැඩි ණය අයදුම්පත් දිවිනැඟුම ප්‍රජා මූල බැංකු සමිති කළමණාකරුවන්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.එහිදි ප්‍රතිලාභියාගේ අවශ්‍යතාවය හෝ ව්‍යාපෘතිය බැංකු කළමණාකරු හෝ බලය පැවරූ නිලධාරියෙකු විසින් පරික්ෂා කිරීමෙන් අනතුරුව ඒ සඳහා වර්තාවක් සකස් කොට අයදුම්පත සමඟ ප්‍රජා මූල බැංකු සමිති කළමණාකරු වෙත ඉදිරිපත් කළ යුතුය .ප්‍රජා මූල බැංකු සමිති කළමණාකරුගේ අනුමැතිය ලද පසු මෙම ණය නිකුත් කළ යුතු වේ.



ආර්.ඒ.ඒ.කේ.රණවක,

අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:-

1. සියලුම ප්රාදේශිය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්.
2. ලේකම්,ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.
3. ලේකම්,මුදල් අමාත්‍යාංශය.
4. දිවිනැඟුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්.
5. දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් /දිස්ත්‍රික්ලේකම්වරුන්.
6. ප්‍රාදේශියලේකම්වරුන්.
7. සහකාර කොමසාරිස්වරුන්.
8. සියලුමදිස්ත්‍රික්දිවිනැඟුම නිලධාරින්.
9. දිවිනැඟුම ප්‍රජා මූල බැංකු සමිති කළමණාකරුවන්.
10. දිවිනැඟුම සංවර්ධන නිලධාරින්.
11. ප්‍රධාන අභ්‍යන්තර විගණක.